# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

**අංක 2489/69 - 2026 මැයි මස 22 වැනි සිකුරාදා - 2026.05.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුළත් වීමේ ගාස්තුවෙන් අය කළ යුතු බද්දෙහි ප්‍රතිශතය පහත උපලේඛනයේ විස්තර කරන ආකාරයෙන් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොළඹ මහා නගර සභාව විසින් 2025.12.31 දිනැති අංක 131 දරන සභා සම්මුතිය බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ප්‍රතිශතයන් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**හනීෆ් යූසුෆ්,**
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර.

2026 මැයි මස 21 වැනි දින,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ලේ,
පළාත් සභා ගොඩනැගිල්ලේ දී ය.


1A - PG 7715 — 06 (2026/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| අනු අංකය | කාණ්ඩය | විනෝද කටයුත්තේ ස්වභාවය | යෝජිත නව විනෝද බදු ප්‍රතිශත |
|---|---|---|---|
| 01 | A | • සිනමා | |
| | | 01. සිනමා ශාලා | 07% |
| | | 02. තාවකාලික සිනමා දර්ශන | 07% |
| 02 | B | • ක්‍රීඩා තරග | |
| | | 01. අන්තර්ජාතික ක්‍රීඩා තරග | 14% |
| | | 02. දේශීය ක්‍රීඩා තරග | 07% |
| | | 03. පාසලක් හෝ ආදි ශිෂ්‍ය සංගමයක් හෝ විද්‍යාලීය සංගමයක් පාසලක් වෙනුවෙන් පවත්වන ක්‍රීඩා තරග | 06% |
| | | 04. පාසල් ක්‍රීඩා සංගම් විසින් පවත්වන තරගාවලි | 06% |
| | | 05. උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍ය සංගමයක් විසින් ශිෂ්‍ය සුබසාධනය සඳහා පවත්වන ක්‍රීඩා තරග | 06% |
| 03 | C | • ප්‍රසංග | |
| | | 01. විදේශීය කලාකරුවන් සහභාගි වන සියලුම ප්‍රසංග හා විනෝද කටයුතු | 10% |
| | | 02. දේශීය කලා ශිල්පීන් සහභාගි වන සියලු ප්‍රසංග | 07% |
| | | 03. විදේශීය ශිල්පීන් සහභාගි නොවන නර්තන ප්‍රසංග, DJ ප්‍රසංග, DINNER DANCE, SING ALONG සහ වෙනත් නැටුම් වැයුම් සහිත ප්‍රසංග | 08% |
| | | 04. සුබසාධක සංගම්, ආදි ශිෂ්‍ය සංගම් සහ එවැනි සමිති හා ලියාපදිංචි සමාජ සංවිධාන විසින් සුභසාධනය සඳහා අරමුදල් රැස්කිරීම වෙනුවෙන් පවත්වනු ලබන ප්‍රසංග | 05% |
| | | 05. දේශීය වේදිකා නාට්‍ය ගීත සහිත ප්‍රසංග | 05% |
| | | 06. නිසි ආයතනයක ලියාපදිංචිය සහිත ක්‍රියාත්මක මට්ටමේ පවතින කලාකරුවන්ගේ සංගමයක් එහි සාමාජිකයන්ගේ සුබසාධනය සඳහා අරමුදල් රැස් කිරීම වෙනුවෙන් පවත්වනු ලබන විනෝද කටයුතු | 05% |
| | | 07. ප්‍රසිද්ධ කලාකරුවෙකු විසින් තම ජීවිතයේ විශේෂ අවස්ථාවක් ලෙස පවත්වනු ලබන ප්‍රසංගයක් සඳහා (ජීවිත කාලය තුළ එක් වරක් සඳහා පමණක්) | 05% |
| | | 08. පාසලක් විසින් පාසලේ සුබසාධනය සඳහා පවත්වනු ලබන අයදුම්කරු විදුහල්පති වන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිත ප්‍රසංග | 05% |
| | | 09. උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍ය සංගමයක් විසින් ශිෂ්‍ය සුභසාධනය සඳහා පවත්වන ප්‍රසංග. | 05% |
| | | 10. දැනට දැඩිව රෝගාතුරව සිටින ප්‍රවීණ කලාකරුවෙකුගේ පිළිකා, වකුගඩු, බරපතල හදිසි අනතුරු හා බරපතල හෘද ස්නායු හා මොළය ආශ්‍රිත රෝග සඳහා වෛද්‍යාධාර පිණිස හෝ අවුරුදු 75 ඉක්ම වූ ප්‍රවීණ කලාකරුවෙකුගේ අවසාන ප්‍රසංගය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් බදු නිදහස් කළ ප්‍රසංගයක් (ජීවිත කාලය තුළ එක් වරක්) | අය නොකෙරේ |
| 04 | D | • වෙනත් විනෝද කටයුතු | |
| | | 01. සියලුම සැණකෙළි ශූර ක්‍රියා (සර්කස්) | 05% |
| | | 02. කාර්නිවල් | 06% |
| | | 03. දේශීය කලාකරුවන් සහභාගි වන මැජික් සංදර්ශන, විකට සංදර්ශන, විචිත්‍රාංග සංදර්ශන හා විචිත්‍රාංග තරග | 05% |
| | | 04. විදේශීය කලාකරුවන් සහභාගි වන මැජික් සංදර්ශන, විකට සංදර්ශන, විචිත්‍රාංග සංදර්ශන හා විචිත්‍රාංග තරග | 08% |
| | | 05. වෙනත් විනෝද ප්‍රසංග | 08% |
| | | 06. හෝලි උත්සව/ සංස්කෘතික උත්සව | 06% |



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.